**හිමිකම් රක්ෂණ අරමුදල -2022**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

හිමිකම් රක්ෂණ අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.

සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග | | | |
| (i) අංක 42 (ආ) | හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් සති 02 කට වරක් හිමිකම් ආදායම් සම්බන්ධ වාර්තා ප්‍රධාන කාර්යාලය වෙත ලබාදිය යුතු වුව ද, සමාලෝචිත වර්ෂය සඳහා එසේ ලබානොදුන් වාර්තා ගණන 141 කි. | ඇතැම් කාර්යාල විසින් අදාල වාර්තා ලබා නොදීම නිසා මෙම තත්ත්වය වාර්තා වී ඇති බව දන්වා තිබුණි. | ආදායම් නිවැරදිව වාර්තා කළ යුතු ය. |
| (ii) අංක 42 (ඉ) | සෑම දින 14 ක් අවසානයේදී ම හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කරගන්නා මුදල් හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ප්‍රධාන මුදල් පොතට වෙන් වෙන් වශයෙන් හර කළ යුතු වුව ද, සියලු හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලයන්හි දෛනික ආදායම්වල එකතුවක් සෑම දිනකම මුදල් පොතට හර කර තිබුණි. | බැංකු වාර්තා අනුව එක් එක් කාර්යාල වශයෙන් ඇතුළත් කිරීම ප්‍රායෝගික වශයෙන් අපහසු වී ඇති බව දන්වා තිබුණි. | ආදායම් නිවැරදිව වාර්තා කළ යුතු ය. |
| (iii) අංක 42 (ඌ) (4) | සෑම මාසයක අවසානයේදී ම හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ මුදල් පොතේ හෝ බැංකු ගිණුමේ කිසිම ශේෂයක් නොතිබිය යුතු වුව ද, 2022 වර්ෂයේ පෙබරවාරි හා මාර්තු මාසයන්හි පිළිවෙලින් රු.605,070 ක් හා රු.92,198 ක් බැගින් මුදල් පොතේ අවසාන ශේෂයන් පැවතුණි. | 2022 පෙබරවාරි මස රු.605,070 ක් වැරදීමකින් ගිණුමට බැරවීම හා මාර්තු මස ආදායම රු.92,198 කින් අඩුවෙන් ගණනය කිරීම හේතු වී ඇති බව දන්වා තිබුණි. | යොමුගත නියෝගයට අනුගත විය යුතු ය. |
| (ආ) 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2019/(I) (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ 02 ඡේදය | කාර්තුවකට අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් හෝ පැවැත්විය යුතු වුව ද, 2022 වර්ෂයේදී එක් රැස්වීමක් පමණක් පවත්වා තිබුණි. | කමිටුවේ සභාපති විටින් විට වෙනස්වීම නිසා නිසි පරිදි කමිටු පැවැත්වීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | යොමුගත නියෝගයට අනුගත විය යුතු ය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.25,466,814 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.21,449,550 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.4,017,264 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හිමිකම් ලියාපදිංචි කිරීමේ ආදායම රු.1,459,190 කින් වැඩිවීම හා භාණ්ඩාගාර ආයෝජන පොළී ආදායම රු.2,345,445 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 42(ආ) හා (ඇ) ප්‍රකාරව හිමිකම් කාර්යාල 11 ක් විසින් එවන ලද වාර්තා පිළිබඳව කරන ලද නියැදි පරීක්ෂාවට අනුව හිමිකම් කාර්යාල 06 ක් විසින් ප්‍රධාන කාර්යාලයට එවන ලද හිමිකම් ආදායම පිළිබඳ වාර්තා 2009 අංක 01 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ (රක්ෂණ අරමුදල්) නියෝග 42(ආ) හා (ඇ) ප්‍රකාරව "ආර්.ජී.ටී/අයි.එෆ් 03" ආකෘතියට අනුකූල නොවුව ද, කළමනාකරණය විසින් නිවැරදි ආකෘතිය සහිත වාර්තා ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාළ ලේඛනය පවත්වාගෙන යාම සඳහා දින 15 කට වරක් වාර්තාවක් ලබා දෙන ලෙස ඉල්ලා ඇතත්, නියමිත පරිදි සියලුම වාර්තා ලබා ගැනීමට අපහසු වී ඇති බව දන්වා තිබුණි. | යොමුගත නියෝගයට අනුගත විය යුතු ය. |
| (ආ) යථෝක්ත නියෝග අංක 42 (ආ) ප්‍රකාරව ප්‍රධාන කාර්යාලයට හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවලින් ලැබෙන වාර්තා ඇතුළත් කිරීමට ආකෘති අංක"ආර්.ජී.ටී./අයි.ඒෆ්.02" අනුව රෙජිස්ටරයක් නඩත්තු කළ යුතු වුව ද, එම රෙජිස්ටරයද අදාළ ආකෘතිය ප්‍රකාරව සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | ආකෘති පත්‍ර ආර්.ජී.ටී/අයි.එෆ්.02 මඟින් හිමිකම් රෙජිස්ට්‍රාර්වරුන් විසින් එකතු කරගත් මුදල් පිළිබඳ වාර්තාවක් වන අතර, හිමිකම් රෙජිස්ට්‍රාර් කාර්යාලවල සියලුම ආදායම් පිළිබඳව තොරතුරු ගෙන්වා ගැනීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. එම වාර්තා ඇසුරින් ප්‍රධාන කාර්යාලය විසින් වාර්තාවක් පිළියෙල කරන අතර, සියලුම වාර්තාවන් නොලැබීම නිසා අදාළ වාර්තාව නිවැරදිව යාවත්කාලීන කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | යොමුගත ආකෘතියට අනුකූල විය යුතු ය. |

| | | |
|---|---|---|
| (ඇ) අරමුදලේ ජංගම ගිණුමට කරන ලද සෘජු බැරකිරීම් හිමිකම් කාර්යාලවලින් ලබාගන්නා ලද තොරතුරු මත සැසඳීම් කර වර්ෂයට අදාළ හිමිකම් ආදායම හඳුනා ගැනීමට ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. | දෛනික ආදායම් එකිනෙක කාර්යාලවලින් හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ නිල බැංකු ගිණුමට බැර කරනු ලබන අතර, අදාළ කාර්යාලය හඳුනා ගැනීම සඳහා වැඩ පිළිවෙලක් නොමැති වීම මෙයට හේතු වී ඇති බව දන්වා තිබුණි. | නිවැරදි ආදායම් ගිණුම්ගත කළ යුතු වීම හා ආදායම් බැර කරන කාර්යාල හඳුනා ගැනීම සඳහා නිසි වැඩ පිළිවෙලක් හඳුන්වා දිය යුතු ය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ඉඩම්වල අයිතිය ලියාපදිංචි කිරීමේදී අයිතිය සම්බන්ධයෙන් වැරදි තීරණයක් ගැනීම හේතුවෙන් පාර්ශවකරුවන්ට සිදුවන අලාභ සඳහා රජය විසින් වන්දි ප්‍රදානය කිරීම අරමුදල පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වුව ද, අරමුදල ආරම්භ වූ 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කිසිදු හානිපූරණ වන්දි මුදලක් ගෙවීම්කර නොතිබුණි. එසේම හිමිකම් රක්ෂණ අරමුදල සම්බන්ධයෙන් පොදු ජනතාව දැනුවත් කිරීම් සිදුකර ඇති බවට විගණනයේදී නිරීක්ෂණ නොවුණි. | පනත සංශෝධනය කිරීම සඳහා දිගින් දිගටම සාකච්ඡා පැවැත්වෙන බැවින් ඉදිරියේදී ඒ පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ කටයුතු සිදු කරන බව දන්වා තිබුණි. | අරමුදලේ මූලික අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළ යුතු යුතු ය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 12 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද, 2022 වර්ෂයේදී කළමනාකරණ මණ්ඩල රැස්වීම් වාර 04 ක් පමණක් පවත්වා තිබුණි. | සිදු කිරීමට ඇති වැඩ ප්‍රමාණය අනුව කළමනාකරණ මණ්ඩල රැස්වීම් පැවැත්වීම මණ්ඩලය විසින් තීරණ කරනු ලබන ඇති බව දන්වා තිබුණි. | සැලස්මට අනුව කටයුතු කළ යුතු යුතු ය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

## 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව මුළු ඇස්තමේන්තුගත ආදායම හා වියදම පිළිවෙලින් රු.23,000,000 ක් හා රු.1,555,500 ක් වූ අතර, 2022 වර්ෂයේදී රු.27,000,000 ක් හා රු.1,216,600 ක් ලෙස ඇස්තමේන්තුගත ආදායම හා වියදම සංශෝධනය කර තිබුණු නමුත්, අනුමත සංශෝධිත අයවැය ලේඛනයේ පිටපතක් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ක්‍රියාකාරී සැලැස්ම සහ අයවැය ඇස්තමේන්තුව අනුමත කළ පසු ඉදිරිපත් කරන බව දන්වා තිබුණි. | අනුමත අයවැය ලේඛනය ඉදිරිපත් කළ යුතු ය. |